# වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
# வடமேல் மாகாண சுகாதார சேவைகள் திணைக்களம்
# Provincial Department of Health Services - North Western

සෞඛ්‍ය සංකීර්ණය, මීගමු පාර, කුරුණෑගල. 60000
சுகாதார வளாகம் நீர்கொழும்பு வீதி குருநாகல் 60000
Health Complex, Negambo Road, Kurunegala. 60000 Sri Lanka
Web : www.healthdept.nw.gov.lk
e-Mail : mail@healthdept.nw.gov.lk


මගේ අංකය : / எனது இல : / My No : NWP/PDHS/AD5/Circular/ 02
ඔබේ අංකය : / உமது இல : / Your No :
දිනය : / திகதி : / Date : 2022.05.31

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ,

කුරුණෑගල /පුත්තලම .

**<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම .</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා , පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10 / 2022 හා 2022.05.25 දිනැති චක්‍රලේඛය හා බැඳේ .

02.උක්ත චක්‍රලේඛය වයඹ පළාත් සභාවට අදාල කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ප්‍රධාන ලේකම්ගේ අංක NWP/CS/AD/1/15/1/2022 හා 2022.05.26 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇති අතර එම චක්‍රලේඛයේ 04 වන ඡේදය කෙරෙහි මෙයින් අවධානය යොමු කරවමි .

04.ඒ අනුව වයඹ පළාත් සෞඛ්‍ය සේවාව ප්‍රශස්ථ මට්ටමින් හා අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් ඇති නොවන අයුරින් පවත්වාගෙන යාම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ,ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල කාර්යය මණ්ඩල අඛණ්ඩව සේවා සැපයිය යුතු වීමත් පවතින අර්බුදකාරී ඉන්ධන සැපයීම් සේවාවන් හා ඉහළ යන ප්‍රවාහන ගාස්තු සඳහා උපක්‍රමික ක්‍රමවේදයක් ලෙස සේවයට පැමිණෙන වාර ගණන අඩුකර ගත යුතු වීමත් යන කරුණු සලකා බලා එක් එක් නිලධරයන් / සේවකයින් සතියකට ආවරණය කළ යුතු අනිවාර්ය රාජකාරී කාලය සේවයේ යොදවා ගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතු අතර එම අනිවාර්ය සේවා කාලය සකස් කර ගැනීම සඳහා නිලධරයන් /සේවකයින්ගේ පැමිණීමේ හා පිටවීමේ වේලාව විධිමත් හා ඵලදායී ලෙස සියළු කාර්යය මණ්ඩලයේ සේවාවන් උපරිම අයුරින් ලබා ගැනීමට හැකි වන පරිදි සේවයේ යොදවා ගැනීමටත් එලෙස තම අනිවාර්ය රාජකාරී කාලය සපුරනු ලබන නිලධරයන්ට හා සේවකයින්ට පමණක් නිවාඩු දින හා අතිකාල සේවයේ යොදවා ගැනීමට කටයුතු කරන ලෙස මෙයින් උපදෙස් ලබා දෙමි .අවම අනිවාර්ය සේවා කාලය සපුරනු ලබන නිලධරයන් හා සේවකයින් හට උපරිම ලෙස විශේෂ නිවාඩු දින දෙකක් සඳහා හිමිකම් ලබා දීමට පියවර ගන්නා ලෙසද තව දුරටත් මෙයින් උපදෙස් ලබා දෙමි .

විශේෂඥ වෛද්‍ය එම්.කේ.සම්පත් ඉන්දික කුමාර ,

වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ .

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

පිටපත් :

1. ප්‍රධාන ලේකම් ,වයඹ - කා : දැ : පි
2. ලේකම් ,සෞඛ්‍ය අමාත්‍යාංශය ,කොළඹ - කා : දැ : පි
3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් ,සෞඛ්‍ය අමාත්‍යාංශය ,කොළඹ - කා : දැ : පි
4. ලේකම් ,සෞඛ්‍ය අමාත්‍යාංශය ,කුරුණෑගල. - කා : දැ : පි


: (+94 ) 037 22 23479, (+94) 037 7393390 (+94) 037 73 93391

# වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
வடமேல் மாகாண சுகாதார சேவைகள் திணைக்களம்
Provincial Department of Health Services - North Western

සෞඛ්‍ය සංකීර්ණය,
මීගමු පාර,
කුරුණෑගල 60000

சுகாதார வளாகம்
நீர்கொழும்பு வீதி
குருநாகல் 60000

Health Complex,
Negambo Road,
Kurunegala. 60000 Sri Lanka

Web : www.healthdept.nw.gov.lk
e-Mail : mail@healthdept.nw.gov.lk


මගේ අංකය :
எனது இல :
My No : NWP/PDHS/AD5/Circular/04

ඔබේ අංකය :
உமது இல
Your No :

දිනය :
திகதி :
Date : 2022.05.31

ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කුරුණෑගල / පුත්තලම
සියළුම වෛද්‍ය අධිකාරිවරුන්,
සියළුම ප්‍රාදේශිය වෛද්‍ය නිලධාරින්,
සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්.
සියළුම ආයතනභාර නිලධාරින්,

<u>පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා</u>
<u>රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති සෞඛ්‍ය ලේකම්ගේ අංක 01/SA10/2022 හා 2022.05.26 දිනැති ලිපිය හා බැදේ.

02.එම ලිපිය මගින් මහජනතාවට සපයනු ලබන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට බාධාවක් නොවන පරිදි අත්‍යාවශ්‍ය අවම කාර්ය මණ්ඩලයක් කැඳවීමට උපදෙස් ලබාදී ඇත.

03.ඒ අනුව රටතුල පවතින ඉන්ධන අර්බුදය හා පොදු ප්‍රවාහන සේවා යථා පරිදි ක්‍රියාත්මක නොවන බැවින් මෙම දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය ආයතනයන්හි සේවාවන්ට බාධාවක් නොවන පරිදි නැවත දැනුම් දෙන තෙක් සේවා මුර ක්‍රමවත්ව (Roster) යටතේ එක් එක් සේවා මුරය සඳහා අත්‍යාවශ්‍ය අවම කාර්ය මණ්ඩලයක් සේවාවට කැඳවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

04.මෙලෙස සේවා මුර සකස් කිරීමේ දී ඔවුන්ගේ අනිවාර්ය රාජකාරි කාලය ආවරණය වන පරිදි හා ඒ ඒ සෞඛ්‍ය ආයතනයන්හි සේවාවන්ට බාධාවක් නොවන පරිදි එක් නිලධාරියෙකුට හෝ සේවකයෙකු සඳහා සතියකට දින 02 ක විශේෂ නිවාඩු 02 ක් ලබා දෙන ලෙසත් උපදෙස් දෙමි.

05.කෙසේ වුවද යම් නිලධාරියෙකුට හෝ සේවකයෙකු සාමාන්‍ය පරිදි සේවාවට වාර්තා කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන්නේ නම් ඒ සඳහා අවස්ථාව ලබා දිය යුතු බව දන්වන අතර ඉහත උපදෙස් අනුව සකස් කරනු ලබන සේවා මුර සටහන් (Roster) ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මගින් අනුමත කරවා ගත යුතුය.

06.තවද සක්‍රිය සේවයේ නොයෙදෙන දිනයන් රාජකාරි දිනයන් සේ සලකා අතිකාල ගණනය කිරීම පිළිබඳව ඉහත ලිපියෙන් උපදෙස් ලබා දි නොමැති බැවින් එම දිනයන් සඳහා අතිකාල ගණනය කිරීමෙන් වලකින ලෙස මෙයින් උපදෙස් ලබා දෙමි.

විශේෂඥ වෛද්‍ය එම්.කේ.සම්පත් ඉන්දික කුමාර,
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

පිටපත්.
01.ප්‍රධාන ලේකම්,වයඹ . - කා:දැ:පි
02.ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය,කොළඹ . - කා:දැ:පි
03.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,සෞඛ්‍ය අමාත්‍යාංශය ,කොළඹ.. - කා:දැ:පි
04.ලේකම් ,සෞඛ්‍ය අමාත්‍යාංශය ,කුරුණෑගල . - කා:දැ:පි


☎ : (+94 ) 037 22 23479, (+94) 037 7393390 📠 (+94) 037 73 93391